# Project 184
# 184 වන ව්‍යාපෘතිය

DP EDUCATION

## Coding School







වෙබ් පිටුව බලන්න

Glitch ආරම්භ කරන්න

LIVEWORKSHEETS

- වෙබ් පිටුව සඳහා Advanced Header එකක් නිර්මාණය කරගමු.




- ඔබට ලබා දී ඇති project එක තුළ මූලික වශයෙන් අවශ්‍ය වන HTML හා CSS codes සකස් ඇත. ඉහත ඇති ආරම්භ කරන්න යන button එක මත click කර ව්‍යාපෘතිය ආරම්භ කරන්න.
- 183 ව්‍යාපෘතියේදී නිර්මාණය කරගත් header එක තවත් අලංකාර කර එහි functionalities වැඩිදියුණු කරමු.
- පළමුව header එක scroll වීමට නිර්මාණය කරමු.web site එක scroll කරන විට header එක ද පහළට ගමන් කිරීම මේ මඟින් සිදුවේ.
- ඒ සඳහා styles file එක වෙත ගොස් එහි header tag එකට අදාළව දැනටමත් ඇති css වලට පහලින් පහත ආකාරයට css add කරගන්න.

```css
header {
  background-color: #ff0000;
  color: white;
  padding: 10px;
  display: flex;
  justify-content: space-between;
  position: fixed;
  width: 99%;
  top: 0;
  z-index: 1000;
}
```

- මෙහි display:flex මඟින් header එක තුළ ඇති elements තිරස් අතට පිහිටීමට නිර්මාණය කරයි.
- Justify-content:space-between මඟින් එම elements අතර දුර සිටින සේ නිර්මාණය කරයි.
- Position:fixed මඟින් header tag එකෙහි පිහිටීම වෙබ් පිටුව පුරාම එක් ස්ථානයක පැවතීම සකස් කරයි.
- Width එක මඟින් header එකෙහි දිග වෙබ් පිටුවේ කොපමණ දිගක් තුළ දර්ශණය විය යුතුද යන්න දක්වයි.
- top:0 මඟින් header එක සඳහා වෙබ් පිටුවේ ඉහළින් default margin එකක් ඇත් නම් එය නැති කර header එක වෙබ් පිටවේ ඉහළින්ම දර්ශනය කරයි.
- Z-index: 1000 මඟින් header scroll වීමේදී අනෙකුත් elements සියල්ලටම ඉහළින් එය ගමන් කිරීම දර්ශණය වීමට සකස් කරයි.

LIVEWORKSHEETS

- එසේ නිර්මාණය කරගත් විට ඔබ වෙබ් පිටුව scroll කිරීමේදී ඒ පසුපස header එකද පැමිණීම සිදු වේ.

- ඉන්පසු header එකෙහි වම්පස ඇති logo එක නිර්මාණය සඳහා index.html file එක තුළ ඇති header tag එක පහත පරිදී update කරන්න. ඔබට යොදාගැනීමට අවශ්‍ය වන logo එකට අදාළ image එක assets folder එකට add කරගන්න.




පෙර ව්‍යාපෘති වලදී ආකාරයටම එසේ add කරගන්නා image එකෙහි URL එක copy කරගෙන src සඳහා එය paste කරන්න. මෙම වෙබ් පිටුවට අදාළ images සියල්ල ඔබට ලබා දී ඇති project එකේ assets folder එකු තුළ ඇතුළත් වේ.

```
<header>
  <div>
    <img
      src="https://cdn.glitch.global/aff39cff-02d9-44cd-8fe6-324d43e42166/logo.png?v=1702791247683"
      alt="School Logo"
      class="logo"
    />
  </div>
  <div class="header-text">
    <h1>DP Education Digital School</h1>
    <p>A School for Life</p>
  </div>
  <div>
    <button class="login-button">Login</button>
  </div>
</header>
```

- header tag එක තුළට ඉහත රතු පැහැති කොටුව තුළ ඇති img tag එක add කරගන්න. ඒ සඳහා class name එකක් add කරගන්න “logo”.
- දැන් logo class name එක සඳහා styles නිර්මාණය කර logo එක නියමිත පරිදී සකස් කරගමු.

```
.logo {
  max-width: 100px;
  height: auto;
  margin-right: 20px;
}
```

LIVEWORKSHEETS

- දැන් header එකෙහි මැද තිබෙන text design කරගමු.
  ඉහත html කොටසෙහි පරිදි h1 tag හා div tag තුළ text add කරගමු.

```
<header>
  <div>
    <img
      src="https://cdn.glitch.global/aff39cff-02d9-44cd-8fe6-324d43e42166/logo.png?v=1702791247683"
      alt="School Logo"
      class="logo"
    />
  </div>
  <div class="header-text">
    <h1>DP Education Digital School</h1>
    <p>A School for Life</p>
  </div>
  <div>
    <button class="login-button">Login</button>
  </div>
</header>
```


header-text නැමැති class name එක සහිත div tag එක තුළ h1 හා p tag දෙකක් භාවිතා කර වෙබ් පිටුව අදාළ ආයතනයේ නම හා slogan එක දර්ශණය කරගත හැකිය.

- header-text නැමැති class name එකට අදාළ css පහත පරිදි වේ.

```
.header-text {
  text-align: center;
}
```

මේ මගින් එම div tag එකෙහි text සියල්ල මැදට align කිරීම සිදු කරයි.

- ඔබ මේ ආකාරයට නිර්මාණය කරගත් විට header එක මේ ආකාරයට දිස්වේ.




- දැන් දකුණුපස ඇති login button එක නිර්මාණය කරගන්නා ආකාරය බලමු.
- ඉහත html කොටසේ ඇති පරිදි div tag එකක් තුළ button tag එකක් භාවිතයෙන් අපට login button එකක් නිර්මාණය කරගත හැකිය.


```
<header>
  <div>
    <img
      src="https://cdn.glitch.global/aff39cff-02d9-44cd-8fe6-324d43e42166/logo.png?v=1702791247683"
      alt="School Logo"
      class="logo"
    />
  </div>
  <div class="header-text">
    <h1>DP Education Digital School</h1>
    <p>A School for Life</p>
  </div>
  <div>
    <button class="login-button">Login</button>
  </div>
</header>
```

LIVEWORKSHEETS

- එසේ නිර්මාණය කරගත් button එක styles මගින් design කරගන්නා ආකාරය පහත පරිදී බලමු.
  ඒ සඳහා button එකට ලබා දුන් login-button class name එක භාවිතා කර පහත පරිදී CSS add කරගන්න.

```css
.login-button {
  width: 80px;
  height: 30px;
  border: 2px solid white;
  background-color: rgb(255,255,255,0);
  border-radius: 10px;
  color: white;
}
```

- Button එකෙහි දිග හා පළල width & height මගින් සලකුණු කරයි. ඒවා පිළිවෙලින් 80px, 30px වේ. ඔබට අවශ්‍ය පරිදී මෙම pixel ගණන වෙනස් කර අවශ්‍ය ප්‍රමාණයේ button එකක් නිර්මාණය කරගත හැකි වේ.
- ඉන්පසු button එකෙහි outline එක නිර්මාණය border මගින් සිදු කරයි. මෙහිදී outline එකෙහි පළල 2px ලෙසත්, line style එක solid ලෙසත්, outline එකෙහි color එක white ලෙසත් සකසා ඇත. ඔබට අවශ්‍ය පරිදී වර්ණය හා පළල වෙනස් කරගත හැකි වේ.
- background-color: rgb(255,255,255,0) මගින් button එකෙහි background color එක සකස් කරයි. මෙහිදී background color එක transparent ලෙස button එක නිර්මාණය කර ඇත. එනම් කිසිඳු වර්ණයක නොමැත. ඒ සඳහා background color එක ලබාදීමේදී භාවිතා කරන rgb color 3 ට පසුව තවත් අගයක් එකතු කිරීම සිදුකරයි. 0 සිට 100 දක්වා අගය වෙනස් කිරීමෙන් opacity එක වෙනස් කරගත හැකිය. 0 ලබාදුන් විට transparent උපරිම වේ.




- ඉන්පසු ඇති style එක වන border-radius මගින් button එකෙහි කොන් 4 රවුම් කිරීම සිදුවේ. එයට ලබාදෙන pixel ගණන අනුව රවුම් වීම වැඩිවේ.
- Color මගින් button එකෙහි font color එක සකස් කරයි. මෙහි font color එක සුදු වර්ණය ලෙස දක්වා ඇත.
- එවිට ඔබට මේ ආකාරයට button එකක් නිර්මාණය කරගත හැකිවේ.




- මෙසේ නිර්මාණය කරගත් button එක තවත් ආකර්ශණීය කරගැනීම සඳහා ඒ වෙත mouse එක ගෙනආ විට (mouseover කළවිට) එහි background color එක හා font color එක වෙනස් වීමට සකස් කරමු.

LIVEWORKSHEETS

- ඒ සඳහා login-button නැමැති class name එකට hover නැමැති event එකක් පහත පරිදී css file එක තුළ දක්වන්න.

```
.login-button:hover {
  background-color: white;
  color: black;
  cursor:pointer
}
```

LIVEWORKSHEETS